# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2285/09 - 2022 ජුනි මස 22 වැනි බදාදා - 2022.06.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/78 (xv) (බී)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

21 වන සහ 139 වන වගන්ති සමග කියවිය යුතු 27(1) වන වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත් වන මා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත, මේ නියමය මගින් ඉහත කී පනතේ 139 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව, එකී පනතේ 21 වන වගන්තිය යටතේ පිහිටුවන ද විශ්වවිද්‍යාලයක් ලෙස සලකනු ලැබිය යුතු, ශ්‍රී ලංකා, ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ, පීඨ සහ අධ්‍යයන අංශ නිශ්චිතව දක්වන ලද 2009 මැයි මස 28 වැනි දින අංක 1603/35 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* (කලින් කලට සංශෝධිත පරිදි වූ) පළ කරන ලද නියමයේ උපලේඛනය, එහි I වන තීරයේ දැක්වෙන "නාගරික සහ ජලජ ජෛව සම්පත් පීඨය" යන අයිතමයට සහ එහි II වන තීරයේ දැක්වෙන ඊට අනුරූපී සටහන්වලට ඉක්බිතිව ම (2022 පෙබරවාරි මස 17 වැනි දින අංක 2267/35 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ නිශ්චිතව දක්වා ඇති) පහත දැක්වෙන සටහන එකතු කිරීම මගින්, සංශෝධනය කරනු ලැබේ :

| "*I වන තීරය*<br>*පීඨය* | *II වන තීරය*<br>*අධ්‍යයන අංශය* |
|---|---|
| පරිගණක පීඨය | 1. විද්‍යාත්මක පරිගණක අධ්‍යයන අංශය |
| | 2. තොරතුරු පද්ධති ඉංජිනේරු විද්‍යා සහ තොරතුරු විද්‍යා අධ්‍යයන අංශය |
| | 3. දැනුම් ඉංජිනේරු විද්‍යා සහ සන්නිවේදන අධ්‍යයන අංශය". |

**ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත්,**
අධ්‍යාපන අමාත්‍ය.

2022 ජුනි මස 10 වැනි දින,
කොළඹ දී ය.

EOG 06 - 0190